# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2048/36 - 2017 දෙසැම්බර් මස 07 බ්‍රහස්පතින්දා - 2017.12.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංක* : 8/3/5/38/(2014)
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2013/PC/339.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොහොන්සිය පත්තුව සුළු කොට්ඨාසයේ, වාරියපොල කොට්ඨාස අංක 10 දියබුබුල (මාතලේ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අංක මා/1714 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0304ක් වූ ඉඩම් කොටස සඳහා මායිම්

**1. කැබලි අංක 01 —වාරියපොල වත්ත — අක්කරමලේ කොටස—මුල් හිමිකම—සිත්ති නලීමා මුක්කාල්**

*උතුරට* : එස්. එච්. අන්වර්ඩීන් සහ තවත් අය හිමිකම් කියන වාරියපොල වත්ත-අක්කරමලේ කොටස; *නැගෙනහිරට* : දිය බුබුල ඔය, මාර්ගය සහ දියබුබුල ඔය; *දකුණට* : දියබුබුල ඔය සහ ඔය අයුබ් අන්සාරි සහ තවත් අය හිමිකම් කියන වාරියපොල වත්ත-අක්කරමලේ කොටස; *බටහිරට* : අයුබ් අන්සාරි සහ තවත් අය හිමිකම් කියන වාරියපොල වත්ත-අක්කරමලේ කොටස සහ මාර්ගය.

ඉහත සඳහන් ඉඩම සඳහා හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 27 වැනි දින පෙ. ව. 10.00ට මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2017 දෙසැම්බර් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති,
ප්‍රාදේශීය ලේකම්/මාතලේ.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, මාතලේ.

12-732

1A - G26751– 14 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.